# කළමනාකරණ කමිටු රැස්වීම

**දිනය** - 2023.08.17

**වෙලාව** - පෙ.ව. 9.30

**ස්ථානය** - **ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප)**

**මූලාසනය** - **ප්‍රදීප් යසරත්න මහතා (ප්‍රධාන ලේකම්)**

**සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය**

| | | |
|---|---|---|
| 1. එල්.ඒ.කළුකපුආරච්චි මයා | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 2. ඩබ්ලිව්.ටී.ඒ.මානෙල් මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 3. ඒ.එම්.එස්.මල්කාන්ති මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) |
| 4. කේ.ඒ.ඩී.කේ.සිරිවර්ධන මයා | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 5. කේ.ආර්.අබේසිරිවර්ධන මයා | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 6. පී.පී.විජේවීර මිය | - | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| 7. කේ.එන්.කේ.සිල්වා මිය | - | ආදායම් කොමසාරිස් (බ.ප) |
| 8. ටී.කේ.ආර්.දිලේශිකා මිය | - | ප්‍රධාන ගණකාධිකාරී (ඉංජිනේරු) |
| 9. පාලිත අබේවර්ධන මයා | - | ප්‍රධාන නීති නිලධාරී, නීති ඒකකය |
| 10. එම්.ඩබ්ලිව්.එස්.කුරේ මයා | - | අධ්‍යක්ෂ (අය වැය) |
| 11. ඕ.සී.නිලූෂිනී මිය | - | අධ්‍යක්ෂ ( ආදායම්) |
| 12. ආර්.පී ගුණවර්ධන මිය | - | අධ්‍යක්ෂ (ගොඩනැගිලි) |
| 13. ඒ.තලංගම මයා | - | මූලස්ථාන ඉංජිනේරු |
| 14. කේ.එන්.සූරියආරච්චි මිය | - | සහකාර ප්‍රධාන ලේකම් (පාලන) |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

ප්‍රධාන ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති කළමනාකරණ කමිටු රැස්වීමේදී ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධව පහත දක්වා ඇති තීරණයන්ට එළඹෙන ලදී.

| අනු අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | නව පත්වීම් ලබා දුන් බහුකාර්ය සංවර්ධන සහයකයින් සම්බන්ධව | බහුකාර්ය සංවර්ධන සහයකයින් සඳහා නව පත්වීම්1882ක් ලබා දුන් අතර ඒ අතරින් සත්‍ය වශයෙන්ම වැඩ බාරගත් බහුකාර්ය සංවර්ධන සහයකයින්ගේ තොරතුරු මේ වන විට අමාත්‍යංශ වලින් ලැබෙමින් පවතින බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) විසින් ප්‍රකාශ කරන ලදී.ඒ අනුව එම තෙරතුරු ලබා දීම සඳහා අමාත්‍යංශ ලේකම්වරුන් වෙත නිශ්චිත දිනයක් ලිඛිතව දැනුම් දෙන ලෙසත් තොරතුරු ලබා නොදෙන අමාත්‍යංශ ලේකම්වරුන් විසින් බහුකාර්ය සංවර්ධන සහයකයින්ට වැටුප් ගෙවීමේ වගකීමද සියලුම අමාත්‍යංශ ලේකම්වරුන් භාරගත යුතු බව දැනුම් දෙන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br><br>තවද අධ්‍යාපන අමාත්‍යංශය හා පළාත් පාලන අමාත්‍යංශය වෙත ලබා දී ඇති බහුකාර්ය සංවර්ධන සහයකයින් සංඛ්‍යාව හා පළාත් පාලන අමාත්‍යංශයෙන් වෙනත් ආයතන සඳහා අනුයුක්ත කර ඇති සේවකයින් සංඛ්‍යාව පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් මීළඟ රැස්විමට ප්‍රථම ලබා දීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) වෙත උපදෙස් ලබා දෙන ලදී.<br><br>එමෙන්ම බහුකාර්ය සංවර්ධන සහයකයින් 1809 දෙනෙකු සඳහා වැටුප් ගෙවීමට මුදල් අමාත්‍යංශය විසින් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යංශය හරහා මේ වන විට ප්‍රතිපාදන ලබාදෙන බවත්, ලබන වසරේ සිට ප්‍රතිපාදන ඉල්ලුම්කර ලබා ගත යුතු බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) විසින් ප්‍රකාශ කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) |
| 02. | ආදායම් දෙපාර්තමේන්තුව අසල ස්ථාපිත කර ඇති ගලිය සම්බන්ධව | ආදායම් දෙපාර්තමේන්තුව අසල ස්ථාපිත කර ඇති ගලිය සකස් කිරීමේදී සවිකර ඇති නලවල ප්‍රමාණය හා ගලියෙහි ගැඹුර පිළිබඳ ගැටළු සම්බන්ධව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) විසින් විස්තර කරන ලදී.<br><br>ඒ සඳහා ස්ථිර විසඳුමක් කඩිනමින් ලබා දීමට කටයුතු කරන ලෙසත් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීමට කටයුතු කරන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු/ මූල්‍ය) |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 03. | බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලෙන් බැහැර කරනු ලබන ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා බඳුන් ලබා දීම සම්බන්ධව | බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ කාර්යාල වලින් බැහැර කරනු ලබන ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය, අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය සමඟ සම්බන්ධීකරණයෙන් ක්ලීන් ටෙක් පුද්ගලික ආයතනය මඟින් රැගෙන යාම සිදු කරනු ලබයි.<br>එතෙක් කාර්යාලවල එම ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය රැස්කර තබා ගෙන නියමිත දිනට බැහැර කිරීමට කටයුතු කරන අතර එසේ ගොඩනැගිල්ලේ කාර්යාල තුල ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය රැස් කිරීමට බහාලුම් ලබා දීම සම්බන්ධයෙන් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) විසින් යෝජනාවක් ඉදිරිපත් කරන ලදී.තවද පරිසරයට හානියක් නොවන පරිදි මෙම අපද්‍රව්‍ය බැහැර කල යුතු බැවින් එම කාර්යාලවල නිලධාරීන්ගේ නිවෙස් වලින් බැහැර කරනු ලබන ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍යද විධිමත් පරිදි එම බහාලුම් වල එක්රැස් කිරීම පිළිබඳ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(ඉංජිනේරු) විසින් තව දුරටත් යෝජනා කරන ලදී.<br>එම යෝජනාව කාලෝචිත බව ප්‍රධාන ලේකම් විසින් අනුමත කළ අතර ඒ සඳහා නිශ්චිත වර්ණයකින් හා පිරිවිතරයකින් යුතු බඳුන් ලබා දීමට තීරණය විය. තවද නිවෙස් වලින් බැහැර කරන ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය මොනවාද යන්න හඳුන්වා දීමට කටයුතු කරන ලෙසත් , බඳුන් තුලට දැමීමට පෙර ඒවා පරීක්ෂා කිරීම සඳහා කාර්යාල වලින් අධීක්ෂණ නිලධාරියෙකු පත් කිරීමටත් තීරණය විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/ ඉංජිනේරු) |
| 04. | වගකීම් කාලය ඉකුත් වීමට පෙර පිළිස්සුනු විදුලි බුබුළු නැවත ලබා ගැනීම සම්බන්ධව | වගකීම් කාලය ඉකුත් වීමට පෙර පිලිස්සී ගිය විදුලි බුබුළු මෙතෙක් ලබා දී නොමැති බවත් ඒ සඳහා එම ආයතනයෙන් රුපියල් ලක්ෂ 17 ක මුදලක් රඳවාගෙන ඇති බවටත් , වසර පහක වගකීම් කාලය මේවන විට ඉකුත් වී ඇති නමුත් ඊට පෙර ඔවුන් දැනුවත් කර ඇති බවත් මූලස්ථාන ඉංජිනේරු විසින් කරුණු දක්වන ලදී.<br>ඒ අනුව ඒ පිළිබඳ එම ආයතනය සමඟ සාකච්ඡාවක් පැවැත්වීමට කටයුතු සූදානම් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br>මූලස්ථාන ඉංජිනේරු |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 05. | කාර්ය සාධන තරඟාවලිය සම්බන්ධව | බස්නාහිර පළාත් සභාවට අයත් ආයතන 1810ක් අතරින් ආයතන 1492 ක් කාර්ය සාධන තරඟාවලිය සඳහා ලියාපදිංචි වී තිබුණි. ම ආයතන සියල්ල නිර්නායක 262 ක් යටතේ විනිශ්චය කිරීමෙන් අනතුරුව දෙවන වටය සඳහා ආයතන 386 ක් සුදුසුකම් ලබා ඇත.එම ආයතන 386 පළාත් සභාවෙන් බාහිර ආයතනවල නිලධාරීන්ගෙන් සමන්විත විනිශ්චය මණ්ඩලයක් හා එම ආයතන වලට අයත් නොවන බස්නාහිර පළාත් සභාවේ විවිධ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා අයතන වලින් තොරාගත් විනිශ්චය මණ්ඩලයක් මඟින් විනිශ්චය කිරිමට බලාපොරොත්තු වන බවත් , මෙම ආයතන විනිශ්චය කිරීම සඳහා සකස් කරන ලද නිර්නායක 262 ක් පදනම් කරගෙන සාරාංශ කර හඳුනාගත් ප්‍රධාන නිර්ණායක 7 ක් යටතේ ආයතන විනිශ්චය කිරීමට කටයුතු කරන බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් පැහැදිලි කරන ලදී.<br><br>එසේම විනිශ්චය මණ්ඩල පුහුණු කිරීම අගෝස්තු මාසය තුල පැවැත්වීමටත් විනිශ්චය කටයුතු සැප්තැම්බර් පළමු සතියේ සිට ආරම්භ කිරිමටත් අපේක්ෂා කරන බවද සඳහන් කරන ලදී. කාර්ය සාධන තරඟාවලිය සඳහා ඉදිරිපත් නොවුනු අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් ආයතන හා පාසැල් සඳහා පැවැත්වෙන අමතර තරඟාවලිය සම්බන්ධයෙන්ද සාකච්ඡා කරන ලදී.<br><br>තවද කාර්ය සාධන තරඟාවලියේ ජයග්‍රහයකයින් සඳහා සහතික පත්‍ර ප්‍රධානෝත්සවය 2023 දෙසැම්බර් මස තුන්වන සතියේදී පැවැත්වීමට කටයුතු කිරිම සුදුසු බව ප්‍රධාන ලේකම් විසින් දැනුම් දෙන ලදී. | සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 06 | ආපන ශාලාවේ මිල ප්‍රදර්ශන තිර හා රූපවාහිණී තිර භාවිතය සම්බන්ධව | ආපන ශාලාවේ සවි කර ඇති මිල ප්‍රදර්ශන තිර හා රූපවාහිනී තිර භාවිතය සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.<br><br>මිල කමිටුව තීරණය කර ඇති මිල ගණන් මිල පුවරු තිරවල ප්‍රදර්ශනය කිරිමටත් , සවිකර ඇති රූපවාහිනී තිරවල ප.ව.11.30 සිට ප.ව.1.30 දක්වා කාලය තුල ශබ්දය නොනැගෙන පරිදි නිලධාරීන්ගේ දැනුම හා රසාස්වාදය ඇති කිරිම සඳහා වැඩසටහන් ප්‍රචාරය කිරිමටත් සුදුසු බව සාකච්ඡා කරන ලදී.<br><br>ඒ අනුව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) ගේ අධීක්ෂණය යටතේ 2023.08.21 වන දින සිට මෙය ක්‍රියාත්මක කිරිමට තොරතුරු තාක්ෂණ සම්පත් අධිකාරියට පැවරීමටත් තීරණය කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 07 | අංශ ප්‍රධානීන් සඳහා පවත්වන පුහුණු වැඩසටහන සම්බන්ධව | අංශ ප්‍රධානීන් සඳහා එක් දින පුහුණු වැඩසටහනක් සූදානම් කරන ලෙස ගරු ආණ්ඩුකාර තුමා විසින් උපදෙස් ලබා දී ඇති බවත් ඒ සඳහා දිනයක් තමා සමග සාකච්ඡා කර එය පැවැත්වීමට කටයුතු සූදානම් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු ) වෙත උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) |
| 08 | බහුකාර්ය සංවර්ධන සහයකයින් සඳහා ආපදා ණය ලබා දීම සම්බන්ධව | බහුකාර්ය සංවර්ධන සහයකයින් විසින් ආපදා ණය ලබා ගැනිමට ඉල්ලීම් ඉදිරිපත්වන බවත් , ඒ සඳහා ක්‍රියා කිරිම සම්බන්ධව සහකාර ප්‍රධාන ලේකම් (පාලන) විසින් කරුණු විමසා සිටින ලදී.<br>ඔවුන් ස්ථිර පත්වීම් ලබා දී ඇති රාජ්‍ය සේවකයන් වන බැවින් අදාළ ඇප කරුවන් ඉදිරිපත් කර ආපදා ණය ලබා දීමට කටයුතු කල හැකි බවට නියෝජ්‍ය ප්රධාන ලේකම් (මූල්‍ය) විසින් කරුණු ඉදිරිපත් කළ අතර අවශ්‍ය ඇපයන් ඉදිරිපත්කර ඔවුන්ට ආපදා ණය ලබා දීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 09 | බස්නාහිර පළාත් සභාවට අයත් කාර්යාල පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණය තුල ස්ථාපිත කිරිම සම්බන්ධව | බස්නාහිර පළාත් සභාවට අයත් පළාත් සභා ගොඩනැගිලි පරිශ්‍රයෙන් පිටත ඇති කුළී පදනම මත පවත්වාගෙන යන කාර්යාල පළාත් සභා ගොඩනැගිලි පරිශ්‍රයෙහි ස්ථාපිත කිරිම සඳහා ආණ්ඩුකාරතුමා විසින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)ගේ සභාපතිත්වයෙන් යුක්තව පත් කරන ලද කමිටුවේ ප්‍රගතිය පිළිබඳව ප්‍රධාන ලේකම් විසින් කරුණු විමසන ලදී.<br>එම වාර්තාව සකස්කර අවසන් කර ඇති බවත් එම වාර්තාවට අනුව බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලෙන් පිටත තිබෙන ආයතන තුනක් ගොඩනැගිලි පරිශ්‍රයෙහි ස්ථාපිත කිරීමට බලාපොරොත්තු වන බවත් ආපන ශාලාවේ VIP පරිශ්‍රයෙහි හා අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය ස්ථාපිත කර තිබූ පරිශ්‍රයෙහි ව්‍යාපාර ලියාපදිංචි කිරිමේ දෙපාර්තමේන්තුව හා ඉඩම් කොමසාරිස් කාර්යාලය ස්ථාපිත කිරීමට බලාපොරොත්තු වන අතර එම ආයතන සඳහා ඉඩකඩ ප්‍රමාණවත් නොවන්නේ නම් ගබඩා කාමර පහසුකම් ඉහළ මහළකින් ලබා දීමේ හැකියාවක් පවතින බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) විසින් වැඩි දුරටත් ප්‍රකාශ කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) ප්‍රමුඛ කමිටු සාමාජිකයන් |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 10 | 2024 අයවැය හා පුනරාවර්තන වියදම් සම්බන්ධව | මේ වන විට වෙන්කර ඇති පුනරාවර්තන වියදම් වලින් විදුලි බලය වෙනුවෙන් රුපියල් මිලියන 75 ක් 80 ක් පමණ මුදලක හිඟයක් පවතින අතර විදුලිය හා ජල බිල්පත් ගෙවීමේ ගැටළුවක් පවතින අතර අනිකුත් පුනරාවර්තන වියදම් සම්බන්ධව ගැටළුවක් නොමැති බවට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>ඒ අනුව 2024 වසර සඳහා ප්‍රතිපාදන ඉල්ලුම් කිරීමේදී ඒ පිළිබඳ සලකා බලා ඉල්ලීම් සිදු කිරීම පිළිබඳ සාකච්ඡා කරන ලදී.<br>තවද 2024 අයවැය පුනරාවර්තන වියදම් සම්බන්ධව අමාත්‍යාංශ , දෙපාර්තමේන්තු හා ආයතන සමඟ මේ වන විට සාකච්ඡා කරමින් පවත්න බවද නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) විසින් සඳහන් කරන ලදී.<br>තවද මන්ත්‍රී වරුන්ගේ ඉල්ලීම් අනුව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු වලින් යෝජනා ඉදිරිපත් වූ අතර ඔවුන් විසින් ව්‍යාපෘති 7683 ක් සඳහා රුපියල් මිලියන 18688 ක මුදලක් ඉල්ලුම් කර ඇත.එවැනි මුදලක් ඒ සඳහා වෙන්කල නොහැකි බැවින් අමාත්‍යාංශ ලේකම් වරුන් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් සාකච්ඡා කර අධ්‍යාපන අමාත්‍යාංශයෙන් රුපියල් මිලියන 1250 ක් , සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් රුපියල් මිලියන 500ක්, පළාත් පාලන අමාත්‍යාංශයෙන් රුපියල් මිලියන 1250 ක්, කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් රුපියල් මිලියන 500 ක්, ප්‍රවාහන අමාත්‍යාංශයෙන් රුපියල් මිලියන 1000 ක්, ලෙස උපරිම රුපියල් මිලියන 4500 ක් ලබා දීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය අනුව එකඟවූ බව ප්‍රධාන ලේකම් විසින් පැහැදිලි කරන ලදී.<br>මෙම මුදල් වෙන් කරන ලද ව්‍යාපෘති පලදායී ව්‍යාපෘතිද යන්න හා පළාත් සභා විෂය පථයට අයත් වන්නේද යන්න පිළිබඳ අමාත්‍යාංශ ලේකම්වරුන් සෑහීමකට පත්විය යුතුය. ඒ අනුව මේ පිළිබඳ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන් සමඟ සාකච්ඡා කර දැනුවත් කල යුතු බවද සාකච්ඡා කරන ලදී.<br>තවද නඩත්තු කටයුතු සඳහා ප්‍රතිපාදන වැය කිරීමේදී 50% ක සීමාවක් නියමකර ඇති අතර එය වාහන ,ගොඩනැගිලි, හා යන්ත්‍ර සූත්‍ර යන සියල්ලටම අදාළ වේ.නමුත් වාහන අලුත් වැඩියා කටයුතු සඳහා 50% ක සීමාව ප්‍රමාණවත් නොවන බැවින් ගොඩනැගිලි නඩත්තු කටයුතු සඳහා පමණක් 50% ක සීමාව පැනවීම සුදුසු බවට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) විසින් යෝජනා කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| | | ඒ අනුව ගොඩනැගිලි නඩත්තු කටයුතු සඳහා පමණක් ප්‍රතිපාදන වැය කිරීමේ 50% සීමාව තුල කටයුතු කිරිමටත් අනෙකුත් නඩත්තු කටයුතු සඳහා එය අදාළ කර නොගැනීමටත් ප්‍රධාන ලේකම් විසින් අනුමත කරන ලදී. | |
| 11 | HRMIS පද්ධතිය සම්බන්ධව | HRMIS පද්ධතියෙහි වර්තමාන තත්ත්වය පිළිබඳ ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) විසින් පැහැදිලි කරන ලදී.<br>මේ පිළිබඳ වැඩිදුරටත් සාකච්ඡා කිරීමට දිනයක් යොදා ගන්නා ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු ) |
| 12 | නිලධාරීන් විශ්‍රාම ගැනීමේදී විශ්‍රාම ගැනිමට අදාළ PD3 ආකෘති විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම සම්බන්ධව | නිලධාරීන් විශ්‍රාම ගන්නා විට විශ්‍රාම වැටුප් ගොනු නිවැරදිව සකස්කර විශ්‍රාම ලබා ගත් දිනට පසුව එළඹෙන මාසයේ සිට නිලධාරියාට විශ්‍රාම වැටුප ලබා ගැනීම හැකිවන පරිදි කටයුතු කල යුතු නමුත් එසේ නියමිත වේලාවට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත විශ්‍රාම වැටුප් ගොනු ඉදිරිපත් නොවීම නිසා එසේ කිරිමට හැකියාවක් නොමැති වී ඇත. එබැවින් ප්‍රධාන ලේකම් කාර්යාලයේ නිලධාරීන් විශ්‍රාම ගැනීමේදී මාස තුනකට පෙර විශ්‍රාම ගැනිමට අදාළ PD3 ආකෘති මාර්ග ගත ක්‍රමයට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කිරිම සුදුසු බවට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් යෝජනාවක් ඉදිරිපත් කරන ලදී.<br>මේ සඳහා එසේ කිරීම සුදුසු බවත් සියලුම අංශ සහයෝගයෙන් කටයුතු කලයුතු වන අතරම විශ්‍රාම ලබා ගන්නා දිනට තුන් මසකට පෙර වැටුප් වර්ධක දිනය යෙදෙන නිලධාරීන් ගේ ගොනු සම්බන්ධව පමණක් ගැටළුවක් මතුවන අතර අනිකුත් නිලධාරීන් සම්බන්ධව ගැටළුවක් පැන නොනගින බවත් ඒ අනුව ඉදිරියේදී විශ්‍රාම ලබා ගන්නා නිලධාරීන්ගේ විශ්‍රාම ගොනු සම්බන්ධව එසේ කටයුතු කිරීම ප්‍රධාන ලේකම් විසින් අනුමත කරන ලදී. | සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 13 | ඉංජිනේරු අංශයේ පුහුණුව ලැබූ බහුකාර්ය සංවර්ධන සහකරුවන් එම අංශයේම සේවයට ලබා ගැනිම සම්බන්ධව | ඉංජිනේරු අංශයේ පුහුණුව ලබාගත් බහුකාර්ය සංවර්ධන සහකරුවන් දෙදෙනෙකුට පත්වීම් ලබා දීමේදී ප්‍රවාහන අමාත්‍යාංශයට පත්වීම් ලබා දී ඇති අතර ඔවුන් නැවත ඉංජිනේරු අංශයට ලබා ගැනීමේ පවතින ගැටළුව සම්බන්ධව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br><br>ප්‍රවාහන අමාත්‍යාංශයේ පවතින පුරප්පාඩු වලට එම බහුකාර්ය සංවර්ධන සහකරුවන් යොදවා ඇති බැවින් ඉංජිනේරු අංශය වෙත ලබා දීමට ඔවුන් නිදහස් කර නොමැති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු ) විසින් කරුණු දක්වන ලදී.<br><br>ඉංජිනේරු අංශයේ කටයුතු සම්බන්ධව පුහුණුව ලබා දී ඇති බහු කාර්ය සංවර්ධන සහයකයින් එම අංශයේ සේවයට අවශ්‍ය බැවින් ඒ පිළිබඳ කටයුතු කිරීම සඳහා ඊට සම්බන්ධ තොරතුරු තමා වෙත ඉදිරිපත් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු ) |
| 14 | සංහිදියාව සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම | ජාතික සමගිය හා සංහිදියාව ශක්තිමත් කිරිම සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන අංශ සම්බන්ධීකරණය කිරිමට ජනාධිපති ලේකම් කාර්යාලයේ පිහිටුවා ඇති විශේෂ කාර්යාලය මඟින් දැනුම් දී ඇති පරිදි බස්නාහිර පළාත තුල ක්‍රියාත්මක කල හැකි ඵලදායී යෝජනා සම්බන්ධ විස්තර යොමු කරන ලෙස දැනුම් දී ඇති බවත් එම යෝජනා ගෙන්වාගෙන පාලන අංශය මඟින් එම තොරතුරු ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යොමු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන ) |
| 15 | හොඳම වාර්ෂික වාර්තා තරඟාවලිය සඳහා ඉදිරිපත් වීම සම්බන්ධව | හොඳම වාර්ෂික වාර්තා තරඟාවලිය සඳහා 2023.08.31 දිනට වාර්ෂික වාර්තා ලබා දීමට කටයුතු කල යුතුවේ. මේ පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා සියළුම අංශ නියෝජනය වන පරිදි කමිටුවක් පත්කර ඇති බවත් බස්නාහිර පළාත් සභාව නියෝජනය කරමින් සහභාගි වන පළාත් භාණ්ඩාගාරය ඒ වෙනුවෙන් සකස් කරන වාර්ෂික වාර්තාව මේ වන විට සකස් කර ඇති අතර තවත් සති දෙකක පමණ කාලයක් ඉතිරිව ඇති බැවින් 2023.08.21 දින කමිටුව රැස්වී මේ පිළිබඳ සාකච්ඡා කිරීමට කටයුතු යොදා ඇති බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) විසින් පැහැදිලි කරන ලදී.<br><br>ඒ අනුව එම වාර්තාව ඉංග්‍රීසි භාෂාවෙන් සිත්ගන්නා සුළු ආකාරයට සකස්කර ඉදිරිපත් කිරිමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( මූල්‍ය) |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 16 | තොරතුරු පනත අනුව තොරතුරු ලබා දීම සම්බන්ධව | තොරතුරු පනත යටතේ යම් කෙනකු තොරතුරු ඉල්ලුම් කිරීමේදී ඒ පිළිබඳ විමසා බලා කටයුතු කරන ලෙසත් , යම් විමර්ශන කටයුත්තක් සම්බන්ධව තොරතුරු ලබා ගැනීමට යමෙකු ඉල්ලුම් කරන්නේනම් එවැනි තොරතුරු ලබා දීමට පෙර එය නීති කටයුත්තක් පමණක් නම් තොරතුරු ලබා දිය හැකි නමුත් විමසා බලා කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 17 | බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ වායු සමීකරණ කටයුතු සඳහා දැනට සේවයේ යොදවා ඇති අයට ස්ථිර පත්වීමක් ලබා දීම සම්බන්ධව | බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ වායු සමීකරණ යන්ත්‍ර නඩත්තු කටයුතු සඳහා ඉංජිනේරු අංශයට අනුයුක්තව පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියේ තදූජීත පදනම මත බඳවාගත් සේවකයෙකු යොදවා ඇති අතර ඔහු ඉංජිනේරු අංශයේ නිත්‍ය සේවකයෙකු නොවන බැවින් වසරක් සඳහා මුදල් ගෙවා ඔහුගේ සේවය ලබා ගත යුතු වේ.එබැවින් ඔහුගේ සුදුසුකම් අනුව පවතින පුරප්පාඩුවකට ඔහු බඳවා ගැනීමට ගරු ආණ්ඩුකාරතුමා සමඟ සාකච්ඡා කිරීම සඳහා 2023.05.24 දින පැවති කළමනාකරන කමිටු රැස්වීමේදී තීරණය විය.නමුත් ඔහු සඳහා පත්වීමක් ලබා දීමේ ගැටළුවක් පවතින බව ආණ්ඩුකාර ලේකම් විසින් දන්වා ඇති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු ) විසින් කරුණු දක්වන ලදී.<br><br>මේ සම්බන්ධව දීර්ඝ ලෙස සාකච්ඡා කිරීමෙන් අනතුරුව පවතින පුරප්පාඩුවක් වෙනුවෙන් ඔහුට පත්වීමක් ලබා දීමට ගරු ආණ්ඩුකාරතුමා සමඟ සාකච්ඡා කිරීම සඳහා තමා වෙත තොරතුරු ලබා දෙන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) |
| 18 | වායු සමීකරණ සේවා කටයුතු කිරීමේ ආයතනයේ ගැටළුව සම්බන්ධව | මේ වන විට බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ වායු සමීකරණ යන්ත්‍ර නඩත්තු කටයුතු ඇක්සස් පෞද්ගලික ආයතනය මඟින් සිදු කරනු ලබයි.නමුත් මෙම ආයතනය විසින් සේවා ගිවිසුම් මාස හතකින් ලබා දීමට කටයුතු නොකර එකවර රුපියල් ලක්ෂ විසි අටකට සේවා ගිවිසුමක් ලබා දීමට කටයුතු කර ඇත. මේ සම්බන්ධව ඔවුන් සමඟ සාකච්ඡා කළ නමුත් සාර්ථක ප්‍රතිඵලයක් නොලැබුණු බැවින් මෙම ආයතනය ඉවත්කර වෙනත් සුදුසු ආයතනයක සේවය ලබා ගැනීම සුදුසු බවට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) විසින් යෝජනා කරන ලදී.<br><br>නඩත්තු කටයුතු සිදු කිරීම ඔවුන් සමඟ පමණක් සිදු කරන බවට ගිවිසුම් ගතව නොමැති බැවින් එම ආයතනය ඉවත්කර ඒ සඳහා සුදුසු ආයතනයක සේවය ලබා ගැනීමට තීරණය විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු/ මූල්‍ය) |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 19 | අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු සම්බන්ධව | අභ්‍යන්තර විගණනයන් සඳහා තොරතුරු හා සාක්ෂි රැස්කිරීමේදී ඒවාට සම්බන්ධ වන නිලධාරීන්ගේ ආත්ම ගරුත්වය ආරක්ෂා වන පරිදි විගණන අංශයට අදාළ තොරතුරු සාක්ෂි ලේඛන ලබා ගැනීම් ආදී කටයුතු සිදු කිරීම සම්බන්ධව ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී.<br>තවද ඉදිරියේදී විදුහල්පතිවරුන් සම්බන්ධව විගණන කටයුතු සිදු කිරීමේදී සුදුසු මාණ්ඩලික නිලධාරීන්ද ඇතුලත් කණ්ඩායමක් යොමු කිරීම සුදුසු බවට තීරණය කරන ලදී. | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| 20 | බස්නාහිර පළාත් වෙබ් අඩවි තරඟාවලිය සම්බන්ධව | බස්නාහිර පළාත් සභාවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මඟින් පවත්වාගෙන යන වෙබ් අඩවි අතුරින් 2024 වර්ෂයේදී හොඳම වෙබ් අඩවි තොරා ගැනීම සඳහා පවත්වනු ලබන තරඟාවලියට අදාළ ව්‍යාපෘති වාර්තාව තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය මඟින් ඉදිරිපත් කර ඇති බවත් එය ඇගයුම් කර නිර්දේශ ලබා ගැනීමට කමිටුවක් පත්කර ඇති බවත් එමඟින් ලැබෙන නිර්දේශ පදනම් කරගනිමින් 2024 වර්ෂයට අදාළව එම තරඟාවලිය පැවැත්වීම සුදුසු බවට තීරණය කරන ලදී.<br>ඒ අනුව ප්‍රථම , දෙවන හා තෙවන ස්ථාන මෙන්ම කුසලතා සහතික ප්‍රදානය කිරීමට බලාපොරොත්තු වන බවද සඳහන් කරන ලදී. | සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත